**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය

**කොළඹ වරායේ ආගමන හා විගමන දෙපාර්තමේන්තු කාර්යාලයේ ජාලකරණ කටයුතු සැපයීම, බෙදීම, ස්ථාපිත කිරීම, බලය පැවරීම සහ නඩත්තු කිරීම සඳහා සේවා දායකයකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය**
**IFB අංකය : DIE/PRO/02/2024/15**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් කොළඹ වරායේ ආගමන හා විගමන දෙපාර්තමේන්තු කාර්යාලයේ ජාලකරණ කටයුතු සැපයීම, බෙදීම, ස්ථාපිත කිරීම, බලය පැවරීම සහ නඩත්තු කිරීම සඳහා සේවා දායකයකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. රුපියල් තුන් දහස් පන්සියයක (රු.3,500.00) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, 05 වන මහලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් **2025.03.10 දින සිට 2025.03.27 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී** මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැකි අතර 3 වැනි ඡේදයේ සඳහන් ව ඇති ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.immigration.gov.lk හරහා හෝ 2025.03.10 දින සිට 2025.03.27 දින දක්වා කාල පරිච්ඡේදය තුළ දී නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට 2025.03.28 වැනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලිපිලේඛන ප්‍රවාහන ආයතනයක් (Courier Service) මගින් එවීම හෝ අතින් ගෙනවිත් ඒ සඳහා 3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇති මිල ගණන් බහා ලනු ලබන පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින හැත්තෑ හතක් (77) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගු කරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

6. සියලුම ලංසු, ලංසු භාරගන්නා අවසාන දින සිට දින එකසිය පහක් සඳහා වලංගු භාවයෙන් යුතු (2025.07.11 දක්වා වලංගු) රුපියල් එක් ලක්ෂ විසිදාහක් (රු. 120,000.

7. **00**) වටිනා බැංකු ඇපකරයක් සමඟ එවිය යුතුය.

8. **2025.03.18** වෙනි දින **ප.ව.2.00** ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, 05 වන මහලේ දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
"සුහුරුපාය",
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.